# ජල මූලාශ්‍ර සංරක්ෂණය සහ ඒ ආශ්‍රිත ගැටළු කළමනාකරණය කිරීම පිළිබඳ අධ්‍යයනයක් (පන්නල ප්‍රාදේශීය සභාවට අයත් හමන්ගල්ල වසම ඇසුරෙන්)

*හේරත්, එච්.එම්.එන්.ටී.*[1]

ශ්‍රී ලංකාවට ජලය, හිග සම්පතක් නොවේ. ජල සම්පත්වල අසමාන භූගෝලීය ව්‍යාප්තිය, වර්ෂාපතන රටාවේ විචලතාවය සහ ජල භාවිතයේ විෂමතා සහ මානුෂ ක්‍රියාකාරකම් හේතුවෙන් ජලය හිග සම්පතක් බවට පත් වී ඇත. මෑතකාලීනව උද්ගත වී ඇති ජල උල්පත් සිදී යාම සහ ජල දූෂණය වීමට බලපෑ ආසන්නත ම හේතු හදුනා ගැනීමේ අරමුණ සහිතව, ජල ගැටළුවට ප්‍රබල බලපෑමක් ඇති කළ මිනිස් ක්‍රියාකාරකම් අධ්‍යයනය කිරීමත්, මිනිස් ක්‍රියාකාරකම් නිසා ජල පෝෂක ප්‍රදේශවලට සිදු වී ඇති හානිය විමර්ශනය කිරීමත්, මිනිස් අවශ්‍යතා වෙනුවෙන් ජලජ සම්පත භාවිතා කිරීමේදී අනුගමනය කළ යුතු පරිසර හිතකාමී පියවරයන් හදුනා ගැනීමේ අරමුණින් අධ්‍යයනය සිදු කරන ලදී. කුරුණෑගල දිස්ත්‍රික්කයේ, පන්නල ප්‍රාදේශීය සභා බල ප්‍රදේශයට අයත් ගමන්ගල්ල වසමේ ප්‍රදේශවාසීන් විසින් මුහුණදෙන පානීය ජල ගැටළුව අධ්‍යයනය වෙනුවෙන් තෝරා ගන්නා ලදී. ජල උල්පත් සිදී යාම, දූෂිත ජලය ජල මූලාශවලට කාන්දු වීම නිසා ප්‍රදේශවාසීන් රෝගීභාවයට පත් වීම පමණක් නොව, ශාක සහ සත්ත්ව ඇතුළු සමස්ත ජෛව පද්ධතියට බලපෑම්කර ඇති ආකාරය නිරීක්ෂණය විය. මෙහිදී ප්‍රදේශවාසී පවුල් සියයක සසම්භාවී නියැදියක් වෙත ප්‍රශ්නාවලි බෙදා හැරීම සහ සම්මුඛ සාකච්ඡා සිදු කිරීම මගින් අධ්‍යයනය සදහා අවශ්‍යය ප්‍රාථමික දත්ත රැස් කරගන්නා ලදී. ප්‍රදේශයේ පරිසර හිතකාමී නොවන අයුරින් පවත්වාගෙන ගොස්, වර්තමානයේ අත් හැරදමා ඇති කර්මාන්තශාලාවක අපද්‍රව්‍යය අවිධිමත් ආකාරයට බැහැර කිරීම නිසා ජල පෝෂක ප්‍රදේශ දූෂණය වීමේ ප්‍රතිඵලයක් වශයෙන් ජල ගැටළුව නිර්මාණය වී ඇති බව අධ්‍යයනය විසින් හදුනා ගන්නා ලදී. මෙම තත්ත්වයට විසදුම් සෙවීමට අදාළ නිළධාරීන්ගේ සහය ලබා ගැනීම, විවෘත සාකච්ඡා සිදු කිරීම, පිරිස සම්බන්ධීකරණ සදහා අවශ්‍යය කටයුතු සම්පාදනය කළ යුතු වේ. එතෙක්, වත්මන් තත්ත්වය කළමනාකරණය සදහා පරිභෝජනයට සුදුසු පරිදි ජලය සකස් කර ගැනීම වෙනුවෙන් ජලය පිරිපහදු කිරීමේ සැලසුම්, පානීය ජල අවශ්‍යතාවය වෙනුවෙන් ජල ව්‍යාපෘතියක සහය ලබා ගැනීම අදාළ නිළධාරී මග පෙන්වීම යටතේ ඉදිරිපත් කර ඇත. මිනිස් ක්‍රියාකාරකම්වලදී පරිසර හිතකාමී පිළිවෙතක් අනුගමනය කිරීමට මාර්ගෝපදේශනය කිරීම, ජල පෝෂක ප්‍රදේශ සංරක්ෂණය වගවීමක්කොට හදුන්වාදීම, පරිසර ගැටළුවක් පවතින අවස්ථාවකදී ස්වයං ආරක්ෂාව සලසා ගැනීම සහ ගැටළුව කළමනාකරණය වෙනුවෙන් පුද්ගල භූමිකාව පිළිබඳ පිරිස දැනුවත් කිරීමට යෝජනා කෙරේ.

**මුඛ්‍ය පද -** *අපද්‍රව්‍ය, ගැටළු කළමනාකරණය, ජල පරිභෝජනය, මානුෂ ක්‍රියාකාරකම්, සංරක්ෂණය.*

[1] ශ්‍රී ලංකා සබරගමුව විශ්වවිද්‍යාලය nirunditharushika@gmail.com